# දැනුමට අත්වැලක්

----ප්‍රස්ථාව පිරුළු සහ ඉඟි වැකි----

1. අකලට හටගත් ගෙඩිය
    - පිරිහුන් ධනය ඇත්තෙකුට හදිසියෙන් ලැබෙන ලාභය
2. අඟින් කිරි දෙවීම
    - නිශ්ඵල වැඩක් කිරීම
3. අගේ ඉඳන් කන කැම
    - කෙනෙකුගෙන් ලාභ ප්රෙයා්ජන ලබමින් සිට ඔහුට විපත් සිදු කිරීම.
4. අත්තික්කා ගහේ මල් පිපීම
    - ඉතා පුදුම දෙයක් සිදුවීම.
5. අටුව කඩා පුටුව සෑදීම
    - වැඩි අලාභයක් අමතක කොට , සුළු ලාභයක් තකා යමක් සිදු කිරීම.
6. අටුවෙන් දූමට පැනීම
    - විපතෙන් වැඩි විපතට වැටීම.
7. කිරි එරවා ගැනීම සඳහා ඇඬීම
    - යම් කිසිවක් ලබා ගැනීම සඳහා කෑ මුර ගෑම.
8. අඩු කලය සෙලවීම
    - මද ඉගෙනුම ලද තැනැත්තාගේ කෑ කෝ ගැසීම.
9. අඬුව තිබෙද්දී අත පුළුස්සා ගැනීම
    - වැරදි ආකාරයක් අනුගමනය කිරීමෙන් කරදරයට පත්වීම.
10. අත හයිය නම් බත නොවැරදීම
    - උත්සහය ඇත්නම් ය ගත හැකි වීම
11. අතරමඟදී අත්වැල කැඩීම
    - අතරමඟදී බලාපොරොත්තුව සිඳීම
12. අත දී ලා දත නියවීම
    - තමන් සතු දැය අනුන්හට දී වෙන කෙනෙකුගෙන් එය ලබාගන්නට තැත් කිරීම.
13. අත්තටු කපා පියාඹන්නට කීම
    - කළ හැකි මඟ අහුරා, කෙනෙකුට කළ නොහැකි වැඩක් නියම කිරීම
14. අතිරසත් තිත්ත වීම
    - ප්‍රමාණය ඉක්මවීමෙන් දුර්විපාක ලැබීම
15. අතු කඩා මොර කෑම
    - ආදායම් මාර්ග සම්පූර්ණයෙන් ම වසා ගැනීම

16.අඳුනන බල්ලන්ගේ බිරීම
- බොරු තර්ජන කිරීම්

17.අනුන්ගේ මඟුල් ගෙදරදී තමන්ගේ ආදරය පෙන්වීම
- අනුනගේ වියදමෙන් කෙනෙකුට සංග්‍රහ කිරීම

18.අන්තිම තුරුම්පුව
- අවසාන උත්සහය

19.අනුන්ගේ පානෙන් එළිය බැලීම
- අනුන්ගේ උපකාරයෙන් කටයුතු කිරීම

20.අන්ධයා ඇතාගේ සැටි කීම
- නියම තත්වය නොදැන නොයෙක් දේ කීම.

21.අනේ කාලේ වනේ වාසේ
- අයහපත් කාලයෙහි නෑ සියන්ගෙන් ඈත් ව වාසය කිරීම

22.අබ කෑ මිනිහාගේ නාහේ දැවීම
- කළ වරද දැනගෙන සිටීම

23.අනුන්ට හෑරූ වළේ තමන් ම වැටීම
- අනුන්ට ඇටවූ උගුලේ තමන් ව හසුවීම.

24.අරුම පුදුම රටේ පණමට පොල් පැටවීම
- පුදුම එළවන යමක් සිදුවීම.

25.අල කොළ සිටුවීම
- හිතේ එකක් ඇතිව අනෙකක් පෙන්වීම

26.අශ්වයාට අං ලැබීම
- වුවමනාවට වඩා අහංකාර වීම

27.අහසේ මාළිගා තැනීම
- පමණ ඉක්මවා බලාපොරොත්තු ඇතිකර ගැනීම.

28.අං ඒම.
- අහංකාරවීම.

29.අං මැදීම
- සටන් කිරීමට සැරසීම.

30.උගුඩුවා ඇටි කෙහෙල් කෑම
- තණ්හාව නිසා කරදරයට වැටීම

31.ආරේ ගුණ නෑරේ
- ජන්ම ගතිය වෙනස් නොවීම.

32.උගුරට හොරා බෙත් කෑම.
- අකමැත්තෙන් යමක් කිරීම

33.කැඳත් රවුළත් දෙකම ඕනෑය.
- යමක් ඉවත දැමිය නොහැකි වීම.

34.කිඹුල් කඳුළු හෙළීම.
- බොරුවට හැඬීම.

35.කිරි යි පැණි යි වාගේ වීම.

- මනා ලෙස ගැලපීම

36.කිරි ගහට ඇන්නා වගෙයි

- ස්ථිර වශයෙන්ම සාර්ථක වීම.

37.කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි.

- අයහපත් පුද්ගලයන් දෙදෙනෙකුගේ හමුවීම.

38.ගලේ කෙටූ අකුර වගේ

- අමතක නොවන

39.ගලෙන් පට්ටයක් ගැනීම

- ලෝභයාගෙන් උපකාරයක් ගැනීම

The National e-learning Portal for The General Education